# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

AAT/60/2020 (NPC)

ඒ.එම්.පී.එච්.කේ.අතපත්තු
**අභියාචක**
**එදිරිව**
ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය :-2026.06.17.**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක සිටී,
අභියාචක පෞද්ගලිකව පෙනී සිටී.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්‍ෂ මාලා බස්නායක මහත්මිය.

## -<u>නියෝගය</u>-

ඒ.එම්.පී.එච්.කේ.අතපත්තු යන මෙම අභියාචක විසින්, **2019.11.21** වෙනි දිනැතිව මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මගින් ඉල්ලා ඇත්තේ, **2014** සහ **2015** යන වර්ෂයන් හී ප්‍රධාන පොලිස් පරීක්‍ෂක ධූරයට උසස් කිරීමට පවත්වන ලද සම්මුඛ පරීක්‍ෂණයේ දී ඔහු වෙත ලබාදිය යුතුව තිබූ ලකුණු සාවද්‍ය හෙයින්, එය නිවැරදි කර ඔහුට ප්‍රධාන පොලිස් පරීක්‍ෂක තනතුර ලබා දීමට නියෝග කරන ලෙසටය. ඉන් අනතුරුව අභියාචක විසින් දන්වා සිටියේ, ඔහු විසින්ම ඉදිරිපත් කරන ලද **2021.11.25** දිනැති ලේඛනය මගින් ඉල්ලා සිටිනු ලබන

සහනය කුමක්ද යන්න සඳහන් කර ඇති බවයි. ඒ අනුව එකී ලේඛනයට අවධානය යොමු කරන ලදි. එම ලේඛනයේ ද කුමන දිනයක සිට බලපවත්වන පරිදි ඔහුගේ උසස්වීම හිමිවිය යුතුද යන්න සඳහන් කර නැත. එහි සඳහන්ව ඇත්තේ 2014 වර්ෂයේ සිට ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර ලබා දීමට නියෝග කරන ලෙසයි. 2014 වර්ෂයේ දී පැවති සම්මුඛ පරීක්ෂණයේ දී අභියාචක වෙත ලකුණු 76.5ක් ලැබිය යුතුව තිබුණ බවට, ඔහු විසින් ඉදිරිපත් කර ඇති 2025.09.26 දිනැති ලේඛනයේ සඳහන්ව ඇත. එහි සඳහන් වන්නේ, 2014.03.19 වෙනි දිනට ඔහු වෙත ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුරට උසස්වීම ලබාදෙන ලෙසයි. මෙම උසස්වීම සම්බන්ධයෙන් වන සම්මුඛ පරීක්ෂණ 2014.03.17 සහ 2014.03.19 දිනවල පවත්වන ලද බව මාලා බස්නායක මහත්මිය දන්වා සිටී.

අභියාචකගේ ඉල්ලීම වන්නේ, ඔහු විසින් සේවය කරන ලද අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් කරන ලද සේවය සඳහා වැඩිපුර ලකුණු 07ක් ඔහුට හිමිවිය යුතු බවයි. ඒ බව අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2011.11.25 දිනැති ලේඛනයේ 7 සහ 8 යන ඡේදවල සඳහන් කර ඇත. ප්‍රශ්නගත සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම සඳහා අභියාචක විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයේ පිටපතක් අභියාචක විසින් ඉදිරිපත් කර ඇත. එය 2013.09.29 වෙනි දින ඉදිරිපත් කර ඇති බව එහි සඳහන් වේ.

එම අයදුම්පත්‍රයේ B දරණ කොටසෙහි, ඔහුගේ පූර්ව සේවා කාලය සම්බන්ධයෙන් වන කරුණු ඇතුළත් කළ යුතුවේ. අභියාචක දන්වා සිටින්නේ, එම තීරුවේ ඇති උපලේඛනයේ ප්‍රථමයෙන් දක්වා ඇති තීරු දෙකට අනුව, ඔහු මහව පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් සේවය කිරීම වෙනුවෙන් ඔහුට ලකුණු ලබා දී නොමැති බවයි. එහි පළවන තීරුවේ සඳහන්ව ඇත්තේ අභියාචක 2002.01.01 දින සිට 2003.01.02 දින දක්වා එම තනතුරේ සේවය කර ඇති බවයි. දෙවෙනි

තීරුවේ සඳහන් වන්නේ 2004.08.19 දින සිට 2008.03.24 දින දක්වා වන කාල පරිච්ඡේදය තුළද ඔහු මහව පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති වශයෙන් සේවය කළ බවයි. ***ඒ අනුව එකී සම්පූර්ණ සේවා කාලය වන, අවුරුදු 04, මාස 07, දින 05ක දක්වා කාලයට ඔහුට නියමිත ලකුණු ලබා දී නොමැති බවට අභියාචක කරුණු ඉදිරිපත් කරයි.***

ඒ සමඟම අභියාචක දන්වා සිටින්නේ ඔහුගේ එම සේවා කාලය වැඩබලන පොලිස්පතිවරයාගේ 2025.03.29 දිනැති ලිපියේ සඳහන්ව ඇති බවයි. එම ලිපියේ පළවන පිටුවේ දැක්වෙන උපලේඛනයේ සඳහන්ව ඇත්තේ, අභියාචක මහව පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස 2002.01.01 දින සිට 2003.01.01 දින දක්වා ද, 2004.08.19 දින සිට 2005.01.20 දින දක්වා ද සේවය කර ඇති බවයි. ***එම ලිපියට අනුව අභියාචක මහව පොලිස් ස්ථානයේ අපරාධ අංශයේ ස්ථානාධිපති ලෙස වර්ෂ 01යි, මාස 05ක කාලයක් පමණක් සේවය කර ඇති බවයි.*** ඒ අනුව පැහැදිලිව පෙනී යන්නේ, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2013.09.29 දිනැති අයදුම් පත්‍රයේ අසත්‍ය තොරතුරු සඳහන් කර ඇති බවයි. එම කරුණු සළකා බැලීමේ දී පෙනී යන්නේ, අසත්‍ය සේවා කාල පරිච්ඡේදයක්, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතේ සඳහන් කර ඇති බවයි.

මේ අවස්ථාවේ දී ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටින මාලා බස්නායක මහත්මිය කරුණු දක්වමින් පවසා සිටින්නේ, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අයදුම්පතේ සඳහන් කාල පරිච්ඡේදය දෝෂ සහගත නිසා, අභියාචකට අදාළ උසස්වීම එම අවස්ථාවේ දී ලබා දී නොමැති බවයි. කෙසේ වෙතත් ඉන් අනතුරුව 2015 වර්ෂයේ දී අභියාචක වෙත ප්‍රධාන පොලිස් පරීක්ෂක තනතුර ලබා දී ඇති බව ඇය තවදුරටත් දන්වා සිටී.

ඉහතින් සඳහන් කර ඇති පරිදි අභියාචක විසින් ඉදිරිපත් කර ඇති 2013.09.23 දිනැති ලේඛනයේ සේවා විස්තර සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු සඳහන් කර ඇති හෙයින්, අභියාචකගේ ඉල්ලීම නිෂ්ප්‍රභ කළ යුතු බව විනිශ්චය අධිකාරයේ මතය වන්නේය.

ඒ අනුව අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-